# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2076/13 - 2018 ජුනි මස 19 වැනි අඟහරුවාදා - 2018.06.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/78 (xiv).

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

20(4)(ආ) වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 20(4)(ආ) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍ය ආචාර්ය විජයදාස රාජපක්ෂ වන මා විසින්, ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ පරිපාලන කටයුතු බරපතල ලෙස අවුල් වී ඇති බවට සහ එම විශ්වවිද්‍යාලයේ බලධාරීන් විසින් එම ආයතනයේ කටයුතු යථා තත්වයට ගෙන ඒමට අපොහොසත් වී ඇති බව ද සෑහීමට පත්වීමෙන් පසු, එකී පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියමයක්, නියමාවලියක්, ප්‍රඥප්තියක්, අතුරු ව්‍යවස්ථාවක්, නියෝගයක් හෝ රීතියක් යටතේ ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ උපකුලපති වෙත පිරිනමන ලද, පනවන ලද හෝ පවරන ලද පිළිවෙලින් යම් බලතල, කාර්යය හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ, ඉටු කිරීමේ හෝ කිරීමේ කාර්යය සඳහා ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ උපකුලපති වෙනුවට නිසි බලධරයා වශයෙන් මහාචාර්ය උමා කුමාරස්වාමි 2018 ජුනි මස 18 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි මේ නියමය මගින් පත්කරමි.

ආචාර්ය විජයදාස රාජපක්ෂ,
උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍ය.

2018 ජුනි මස 18 වැනි දින,
කොළඹ දී ය.

07 - 66

1A - PG 4084 — 507 (2018/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*